# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date | 2016-08 - 12 |
|---|---|---|---|

පැමිණිලිකරු : ඩබ්.ජී.එම්.ජී.එස් රත්නායක මයා,
අංක : 183/11/ඒ, පහළතැන්නේකුඹුර,
මහනුවර.

වගඋත්තරකරුවන් : විදුහල්පති,
මහ/ධර්මරාජ විද්‍යාලය,
මහනුවර.

<u>පැමිණිලි අංකය : **HRC/K/52/16**</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ 2016 පළමු ශ්‍රේණිය සඳහා තම දරුවා වන ඩබ්.ජී.එම්. සදූෂ සෙහාන් රත්නායක යන අය වගඋත්තරකාර විද්‍යාලයට ඇතුළත් කර ගැනීමේ අරමුණින් ආසන්න පදනම මත අයදුම්පත් යොමු කරන ලද බවයි. ඒ අනුව සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු 80 ක් උපයාගත් බවත්, ආසන්න පාසල් සඳහා ලකුණු 20 ක් ඉවත් කර ඇති අතර තම පදිංචි ස්ථානයට ආසන්න නොමැති පාසැල් දෙකක් සඳහා අසාධාරණ ලෙස ලකුණු 10 ක් අඩු කිරීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් අභියාචනා පරීක්ෂණයට ඉදිරිපත් වී දැනුම් දුන් නමුත් තම දරුවාට මෙම පාසලට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි කර ඇති බව සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-

වගඋත්තරකාර මහ/ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් මෙම පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට,

| | |
|---|---|
| ඡන්ද හිමි නාම ලේඛනය සඳහා | - ලකුණු 35 |
| පදිංචිය තහවුරු කිරීම සඳහා | - ලකුණු 10 |
| පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන සඳහා | - ලකුණු 05 |
| ආසන්න පාසල් සඳහා | - ලකුණු 30 ක්ද වශයෙන් |


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 165,කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08. | සභාපති / தவிசாளர் / Chairman | 011-2696470 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2696470 | ඊමේල් / மின்னஞ்சல் / e-mail | sechrc@sltnet.lk |
| දුරකථන / தொலைபேசி / Telephone | 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම් / செயலாளர் / Secretary | 011-2689558 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 011-2689558, 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

මුළු ලකුණු 80 ක් උපයාගෙන ඇති බවත්, ඉන් අනතුරුව පැමිණිලි පාර්ශවීය අභියාචනය සලකා බලා ස්ථාන පරීක්ෂාවක් සිදුකර පදිංචියට අනුව නිවැරදිව ආසන්න පාසැල් සම්බන්ධයෙන් තීරණය කිරීමෙන් අනතුරුව පැමිණිලිකරුගේ ලකුණු ප්‍රමාණය වෙනසක් නොවීම මත කඩඉම් ලකුණු සීමාව ලකුණු 86 ක් වන බැවින් මෙම ඉල්ලුම්කරුගේ දරුවා පාසලට ඇතුළත් කර නොගත් බවත් සඳහන් කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකරුගේ දරුවා 2016 වර්ෂයේ පළමු වසරට ඇතුළත් කර ගැනීම සඳහා ආසන්න පදනම යටතේ මහ/ධර්මරාජ විද්‍යාලයට අයදුම්පත් ඉදිරිපත් කර සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමෙන් පසු ලකුණු 80 ක් උපයාගෙන ඇති අතර පැමිණිලි පාර්ශවයේ පදිංචි ස්ථානය නිවැරදි බවට වගඋත්තර පාර්ශවය විසින් තහවුරු කර ඇත.

නමුත් ගුවන් දුර අනුව සලකා බැලීමේදී පාසල් 04 ක් සඳහා ලකුණු 20 ක් ඉවත් කර ඇති බවට නිරීක්ෂණය වේ. මේ සම්බන්ධයෙන් පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ තම පදිංචියට ආසන්න නොමැති අම්පිටිය සිද්ධාර්ථ සහ අම්පිටිය බෙරවස්ට් විද්‍යාලය යන විද්‍යාල සඳහා ලකුණු 10 ක් ඉවත් කිරීම නිවැරදි නොවන බවත් එම පාසල් තම පදිංචි ස්ථානයේ සිට කි.මී 8 ක් පමණ දුරින් පිහිටා ඇති බවත්ය. එම විද්‍යාල සඳහා යාමට නම් වගඋත්තරකාර ධර්මරාජ විද්‍යාලය පසුකර යායුතු බවත් ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් හිතාමතාම අසාධාරණ ලෙස මෙම ලකුණු අහිමි කරන ලද බවත් එසේ සිදු නොවූයේ නම් මුල් අවස්ථාවේදීම තමා වෙත ලකුණු 90 ක් හිමිව තම දරුවාට පාසලට ඇතුළත් වීමට අවස්ථාව ලැබෙන බවද සඳහන් කර ඇත.

පාසල් වල පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේ චක්‍රලේඛනය ප්‍රකාරව ආසන්න පදනම මත ලකුණු ලබා දීමේදී පාසලට ඇති දුර සලකා බැලීම සඳහා උපයෝගී කර ගන්නා නිර්ණායක ඉතා දුර්වල බව පැහැදිලිව පෙනී යයි. දුර සලකා බැලීම පිළිබඳ යොදා ගත යුත්තේ කුමන ක්‍රමවේදයද යන්න චක්‍රලේඛනයේ සඳහන් නොවන බැවින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල අභිමතය පරිදි එය සිදුකරනු ලබයි.

අහස්දුර සලකා බලා අවට පාසල් වලට ලකුණු කැපීම ඉතාමත් අසාධාරණ ක්‍රියාවලියක් වන අතර අයදුම්කරුවන් මෙම පාසැල් සඳහා ගුවනින් නොයන අතර මොවුන්ගේ එකම ප්‍රවේශ මාර්ගය පැහැදිලිව හඳුනාගත හැකිව තිබියදී ඔවුන් අයදුම්කළ පාසල පසුකර යා යුතු දුර පිහිටි වෙනත් පාසල් සඳහා ලකුණු අහිමි කිරීම සෑහීමකට පත්විය නොහැකි කරුණක් බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

**නිගමනය :-**

පැමිණිලිකරු තම දරුවා 2016 වර්ෂයේ පළමු වසරට මහ/ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා ආසන්න පදනම යටතේ සම්මුඛ පරීක්ෂණයට හා අභියාචනා පරීක්ෂණයට ඉදිරිපත් වීමේදී අහස්දූර සලකා බලා සාධාරණ නොවන අයුරින් පාසැල් 2 ක් සඳහා ලකුණු 10 ක් අහිමි කිරීම තුළින් පැමිණිලිකරු අගතියක් සිදුව ඇති බවට කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇත.

එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට ආරක්ෂා කර දී ඇති ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙම පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

මෙම පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්.ජී.එම්. සදුෂ සෙහාන් රත්නායක දරුවා 2016 වර්ෂයේ මහ/ධර්මරාජ විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

2016.05 .31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

පිටපත 1. ලේකම්
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල

2. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර

B/